# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 47 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 ඔක්තෝබර් මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී..

---


2007 ඔක්තෝබර් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 4.00 යි.    තැපැල් ගාස්තුව :  රු. 5.00 යි.

**2007 අංක 47 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2007 ඔක්තෝබර් මස 15 වන දින]

එල්. ඩී. —ඕ. 37/2007.

**2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2007 අංක 47 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

කෙටි නාමය.

2. 2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනතේ 2 වන වගන්තියේ, "සියයට 2.5 ක අනුප්‍රමාණයකට" යන වචන වෙනුවට "සිලින්ඩර ධාරිතාව 1600 නොඉක්මවන මෝටර් වාහනයක් සම්බන්ධයෙන් සියයට 2.5 ක අනුප්‍රමාණයක්, සිලින්ඩර ධාරිතාව 1600 සහ 2000 අතර වන මෝටර් වාහනයක් සම්බන්ධයෙන් සියයට 5 අනුප්‍රමාණයක් සහ සිලින්ඩර ධාරිතාව 2000 ඉක්මවන මෝටර් වාහනයක් සම්බන්ධයෙන් සියයට 7.5 ක අනුප්‍රමාණයක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2—PL 002381—3,600 (2007/08)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.